රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 35/95

මගේ අංකය : 0266/2/68/එල්/ඒ- IX වෙළුම
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995 නොවැම්බර් 21 වෙනි දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 1996

පහත සඳහන් රජයේ නිලධරයන්ට, 1996 වර්ෂයේ රු:1000/- කට නොවැඩි වන විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට තීරණය කර ඇත.

(අ) රජයේ සියළුම ස්ථිර නිලධරයෝ විශේෂ අත්තිකාරම් ලැබීම සඳහා සුදුස්සෝ වෙති.

(ආ) අත්තිකාරම් ගෙවීම් දිනට පූර්වාසන්නයේ තුන් මසකට නොඅඩු කාලයක අඛණ්ඩ සේවාවක් ඇත්තාවූද, ණය මුදල් ආපසු අයකර ගතයුතු සම්පූර්ණ කාලසීමාව තුලදී (එනම් අඩු වශයෙන් 1996 දෙසැම්බර් අවසාන දක්වා) අඛණ්ඩ සේවයේ යෙදවීමට නිශ්චිත වශයෙන් අවකාශ ඇත්තාවූද, තාවකාලික හෝ අනියම් පදනමක් මත සේවය කරන නිලධරයෝද මෙම අත්තිකාරම් ලැබීමට සුදුස්සෝ වෙති.

(ඇ) තාවකාලික හා අනියම් සේවකයන් සඳහා මෙම අත්තිකාරම් මුදල ගෙවන්නේ නම් ස්ථිර සේවක ඇපකරුවෙකු ලබාගත යුතුය.

02. 1977 වර්ෂයේ සිට 1995 වර්ෂය දක්වා ලිත් වර්ෂයන්හි ලබාගත් යම් විශේෂ බැංකු ණය/විශේෂ අත්තිකාරම් මුදල් කොටස් ගෙවීම පැහැර හැර ඇති යම් කිසි පුද්ගලයෙකුට 1996 වර්ෂයේ දෙනු ලබන විශේෂ අත්තිකාරම් මුදල ලැබීමට හිමිකම් නොමැත.

03. මෙම අත්තිකාරම් ගෙවීම 1996.01.01 වන දින පටන් ගෙන 1996.02.29 දිනෙන් අවසන් කල යුතුය. 1996.02.29 වන දිනට පසු ගෙවීම් නොකල යුතුය.

04. මෙම අත්තිකාරම් මුදල " රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් මුදල් - ' බී' ගිණුම" ට හර කල යුතුය.

05. මෙම අත්තිකාරම් මුදල් සමාන මාසික කොටස් දහයකින් 14% බැගින් වූ සමාන මාසික පොලිය ද සහිතව අය කර ගතයුතුය. රු: 1000/- අත්තිකාරම් මුදල සඳහා මාසිකව අය කෙරෙන සමාන මාසික පොලිය රු:6.42 කි. රු: 1000/- ට අඩු අත්තිකාරම් මුදල් සඳහා සමානුපාතික මාසික පොලියක් අයකල යුතුය.

06. මෙම අත්තිකාරම් මුදල සම්බන්ධයෙන් අඩුකර ගැනීම් ආයතන සංග්‍රහයෙහි xxiv පරිච්ඡේදයේ 3 වගන්තියේ සහ අංක:238 වැනි මුදල් රෙගුලාසියෙහි සඳහන් වන 33 1/3% හෝ 40% සීමාවෙන් නිදහස්ය.

07. අයකරගනු ලබන මූලික මුදලේ කොටස මෙම අත්තිකාරම් ගෙවනු ලබන "රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් මුදල්- 'බී' ගිණුමට" බැර කලයුතුය. අයකර ගනු ලබන පොලිය ආදයම් ශීර්ෂ 5, ලැබුණු බදු කුලී, පොලී හා ලාභාංශ, උප ශීර්ෂ 2 පොලී විෂය 4 - අනිකුත් යන ආදයම් ශීර්ෂයට වෙනම බැර කල යුතුය. අයකර ගැනීම් 1996.12.31 වන දිනට අවසන් විය යුතුය.

08. මෙම අයකර ගැනීම් " රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමෙන්" ගෙවනු ලබන උත්සව අත්තිකාරම් හෝ වෙනත් අත්තිකාරම් සමඟ හෝ 1977,78,79 වර්ෂයන්හිදී දෙන ලද විශේෂ බැංකු ණය සමඟ මිශ්‍රකර නොගත යුතුය.

09. ගෙවීම් මූලික මුදලේ කොටස් අයකර ගැනීම් සහ සමාන මාසික පොලිය අයකර ගැනීමේ සටහන් කර ගැනීම සඳහා සී.සී.10 පොදු ආකෘතියේ වෙනම ලේඛණයක් පවත්වාගෙන යායුතුය.

10. අත්තිකාරම් ගිණුමේ සීමාවන් සංශෝධනය කිරීම අවශ්‍ය වූ විට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් මු.රෙ.503 හා 1987.09.11 දිනැති රාජ්‍ය ව්‍යාපාර අංශයේ චක්‍රලේඛ ලිපි අංක: 43 අනුව ක්‍රියාකල යුතුය.

11. මෙම විශේෂ අත්තිකාරම් මුදල ගෙවීමේ හේතුවෙන් 1996 දී විශේෂ බැංකු ණය ගෙවනු නොලැබේ.

12. පිටතට මාරු වී යන නිලධරයෙකු සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුමෙන් දෙනු ලබන අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමේ සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රියා පරිපාටිය අනුගමනය කරන ක්‍රියා පරිපාටිය අනුගමනය කල යුතුය. එනම් අත්තිකාරම් මුදලේ ආපසු ගෙවීමට ඇති ශේෂය, "රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් 'බී' ගිණුමට" හර කරමින්, නිලධරයා ලබාගන්නා දෙපාර්තමේන්තුව විසින් නිලධරයා මුදහරින දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය. ඉන්පසුව ණය වාරික කොටස් දිගටම අයකර ගතයුතු අතර, කෙසේ හෝ 1996 දෙසැම්බර් මස අවසන් වන විට සම්පූර්ණ අත්තිකාරම් මුදල අයකර ගැනීමට වගබලා ගතයුතුය.

13. මෙම ක්‍රමය යටතේ අත්තිකාරම් මුදල් ලබාගත් යම් නිලධාරියෙකුගේ සේවය අවසන් කලහොත් ඔහුගෙන් අයවීමට ඇති අත්තිකාරම් මුදල් ශේෂය (සමාන පොලියක් සමඟ) ඔහුගේ විශ්‍රාම වැටුපෙන්/අර්ථසාධක අරමුදලෙන්/ඇප මුදලෙන්/පාරිතෝෂිකයෙන් හෝ ඔහුට ගෙවීමට ඇති වෙනත් මුදලකින් ද, තාවකාලික නිලධරයෙකු වන්නේ නම්, ඔහුගේ අවසන් මාසික වැටුපෙන් ද අයකර ගැනීමට ගෙවීම් සහ ආයතන ඒකක වග බලා ගත යුතුය.

14. මෙම අත්තිකාරම් ගෙවනු ලබන්නේ අංක: 293 හා 1985.06.03 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ යටතේ ගෙවනු ලබන ණය/අත්තිකාරම් වලට අමතරවය.

15. අංක 268 හා 1984.09.25 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමුණා තිබූ ආදර්ශ ඉල්ලුම් පත්‍රය අවශ්‍ය පරිදි සංශෝධනය කොට මෙම අත්තිකාරම් සඳහා ඉල්ලුම් පත්‍ර ගෙවීම් නිලධාරියා සකස් කල යුතුය.

16. කරුණාකර මෙම චක්‍රලේඛයෙහි අඩංගු වන කරුණු ඔබ දෙපාර්තමේන්තුවේ සියළුම සුදුසුකම් ලබන නිලධරයන්ට දැන ගැනීමට සලස්වන්න.

17. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරන ලදී.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය